# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1972/10 - 2016 ජුනි මස 21 වැනි අඟහරුවාදා - 2016.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2009.

### 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(4) වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 53 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකසන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2016 ක් වූ ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. (1) මෙම රීති, 2016 අංක 02 දරන විදුලිබල (ප්‍රසම්පාදන) රීති ලෙස හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු ''බලපත්‍රලාභියා'' ලෙස හඳුන්වනු ලබන) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් සිදු කරනු ලබන විදුලිබල ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

2. (මෙහි මින් මතු ''ව්‍යාපෘතිය'' ලෙස හඳුන්වනු ලබන) නව විදුලිබල උත්පාදන පිරියතක් හරහා හෝ පවත්නා පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීම මගින් නව විදුලිබල උත්පාදන ධාරිතාව ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර බලපත්‍රලාභියා විසින් පනතේ 43 (2) වගන්තිය ප්‍රකාරව පහත දැක්වෙන කරුණු ඇතුළු අදාළ සියලුම තොරතුරු ඇතුළත් යෝජනාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(i) යෝජනාව පදනම් වූ කොමිෂන් සභාව අනුමත කළ (මෙහි මින් මතු ''LTGEP'' ලෙස හඳුන්වනු ලබන) දීර්ඝ කාලීන අඩුම පිරිවැය උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලැස්මේ නිශ්චිතව දක්වා ඇති අනාගත ඉල්ලුම කෙරෙහි යොමුව සමග ව්‍යාපෘතියට අදාළ විය හැකි අදාළ තොරතුරු පිළිබඳ උපුටා ගැනීමක් ;

(ii) නව උත්පාදන ධාරිතාව නව උත්පාදන පිරියතක් හරහා හෝ පවත්නා විදුලිබල උත්පාදන පිරියතක් කිරීම මගින් ප්‍රසම්පාදනය කරන්නේ ද යන්න සහ ඒ සඳහා හේතු ;

(iii) අනිකුත් දේ අතර, පවත්නා හෝ නුදුරු අනාගතයේ දී ලබා ගැනීමට හැකි බවට සාධාරණව අපේක්ෂා කළ හැකි නව තාක්ෂණයන් ඇතුළත්ව කුමන හෝ කරුණක් හේතුවෙන් LTGEP හි අදාළ විධිවිධාන අභාවිත හෝ යල්පැන නොගිය බවට සහතික කිරීමක් ;

(iv) තාක්ෂණය, ශක්‍යතා අධ්‍යයන වැනි නව උත්පාදන ධාරිතා ප්‍රසම්පාදනයට තෝරා ගත් අවම - පිරිවැය විකල්ප පිළිබඳ සංවේදතා අධ්‍යයනයන්, සිදුවීම් විශ්ලේෂණයන් පිළිබඳ විස්තර, වැඩිදුර විස්තර විශ්ලේෂණය ;

1A - G 23681 — 09 (2016/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(v) ව්‍යාපෘතියේ විෂයපථයට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය :-

(අ) ප්‍රසම්පාදනය කිරීමට නියමිත යෝජිත මුළු නව උත්පාදන ධාරිතාව ;

(ආ) නව උත්පාදන ධාරිතාවේ සමස්තය එක් උත්පාදන පිරියතකින් හෝ පිරියත කීපයකින් ප්‍රසම්පාදන කරන්නේ ද යන්න පිළිබඳ විස්තර ;

(ඇ) උත්පාදන වර්ගය, හඳුනාගත් තාක්ෂණය, බලශක්ති මූලාශ්‍රය හෝ ඉන්ධන වර්ග ;

(ඈ) පිරියතේ ජීවිත කාලය තුළ අපේක්ෂිත මෙහෙයුම් ක්‍රියාවලියට දායක වන තත්ත්වයන් ;

(ඉ) නව උත්පාදන ධාරිතාව යොදා ගැනීමට නියමිත ජාලක උපපොළ ; සහ

(ඊ) විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුමේ කාලසීමාව ;

(vi) මේ යටතේ කොමිෂන් සභාවට යෝජනාවක් භාර දුන් දිනයේ සිට ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් දක්වා ව්‍යාපෘති කාලසීමාවන් ;

(vii) තාක්ෂණික පිරිවිතර සහ යෝජිත ව්‍යාපෘතියේ විස්තර ;

(viii) යෝජිත අයකුම ව්‍යුහය ;

(ix) බලපත්‍රලාභියා උත්පාදන බලපත්‍ර දරන්නෙකුගේ හෝ අනාගත උත්පාදන බලපත්‍ර දරන්නෙකුගේ තත්ත්වයෙන් ලංසුතැබීමේ ක්‍රියාවලියට සහභාගිවීමට යෝජනා කරන්නේ ද යන්න පිළිබඳ ප්‍රකාශය ;

(x) නව උත්පාදන ධාරිතාවේ භාර ස්ථාපනය (නව උත්පාදනය පාදක භාරයක් ලෙස හෝ වෙනත් ආකාරයකට භාවිතා කරන්නේ ද යන වග).

(xi) කෙටුම්පත් යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනය.

3. බලපත්‍රලාභියා විසින් කොමිෂන් සභාව වෙත යෝජනාව ඉදිරිපත් කළ විට, කොමිෂන් සභාව විසින් යෝජනාව සලකා බැලිය යුතු වන අතර, අවශ්‍ය වන්නේ නම්, වෙනත් පිරියත විකල්ප සම්බන්ධයෙන් සැලකීමේ දී තෝරා ගත් පිරියත විකල්පයේ ශක්තිමත්භාවය පරීක්ෂා කිරීමට සධාරණ විය හැකි වැඩිදුර සංවේදතා අධ්‍යයන සහ සිදුවීම් විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා බලපත්‍රලාභියාට නියම කළ හැකි වන අතර බලපත්‍රලාභියා විසින් එහි ප්‍රතිඵල කොමිෂන් සභාවට වාර්තා කළ යුතු ය.

4. කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්, යෝජනාව සමග නව උත්පාදන ධාරිතාව ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් කැඳවමින් බලපත්‍රලභියා විසින් පළ කරනු ලබන දැන්වීමේ කොටසක් වන යෝජනාව සඳහා වන කෙටුම්පත් ඉල්ලීම කොමිෂන් සභාව අනුමත කළ යුතු ය.

5. කොමිෂන් සභාව, යෝජනාව අනුමත කිරීමෙන් පසු, යෝජනාව සඳහා ඉල්ලීමේ ලේඛනය පිළිබඳ දැන්වීම එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දිනපතා පුවත්පතක පළ කරන ලෙසටත් සම්ප්‍රේෂණය බලපත්‍රලාභියාගේ වෙබ් අඩවියේ පළ කරන ලෙසටත් බලපත්‍රලාභියාට දැනුම් දිය යුතු ය.

6. බලපත්‍රලාභියා විසින් අනුමත කරන ලද යෝජනාව ඉල්ලීමේ ලේඛනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

7. ව්‍යාපෘතිය සඳහා වූ පිරිවිතර යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනයට ඇතුළත් විය යුතු අතර, ව්‍යාපෘතිය සඳහා පිරිවිතර සකස් කිරීමේ දී, බලපත්‍රලාභියා විසින් හේතු සහගතව ප්‍රායෝගික වන තාක් දුරට පිරිවිතර තුළ පහත තොරතුරු ඇතුළත්වන බවට සහතික කර ගත යුතු ය :-

(1) පහත සඳහන් කරුනු ඇතුළත් විස්තරාත්මක යෝජිත ව්‍යාපෘතිය :-

(අ) බලපත්‍රලාභියාගේ ජාල පද්ධතියේ විස්තරයක් ;

(ආ) පහත සඳහන් දේ ඇතුළත් ව්‍යාපෘති විෂය පථය :-

(i) ප්‍රසම්පාදනය කිරීමට නියමිත යෝජිත මුළු නව උත්පාදන ධාරිතාව ;

(ii) නියමිත නව උත්පාදන ධාරිතාව අදාළ කිරීමට නියමිත ජාල උපපොළ ;

(iii) උත්පාදන වර්ගය, හඳුනාගත් තාක්ෂණ, බලශක්ති මූලාශ්‍රය හෝ ඉන්ධන වර්ග ;

(iv) පිරියතට සම්බන්ධ වෙනත් අවශ්‍යතා ;

(v) විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුමේ කාලසීමාව ; සහ

(vi) පිරියතේ ජීවිත කාලය ඇතුළත අපේක්ෂිත මෙහෙයුම් ක්‍රියාවලියට පාදක වන තත්ත්වයන් ;

(ඇ) පහත සඳහන් දේ ඇතුළත් ස්ථාන පිහිටීම් සහ උපයෝගිතා පිළිබඳ විස්තරයක් :-

(i) හඳුනාගත් අන්තර් සම්බන්ධතා ස්ථාන හෝ සාමාන්‍ය භූගෝලීය ප්‍රදේශ ;

(ii) එක් එක් ස්ථානය සඳහා ධාරිතාවල සහ සම්බන්ධතා වෝල්ටීය මට්ටම්වල සීමාවන් ; සහ

(iii) ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට යෝජිත බලශක්ති මූලාශ්‍රයේ විස්තරයක්, එය භාවිතා කිරීමට නියමිත ආකාරය සහ එයට අදාළ වෙනත් විස්තර,

(ඈ) ව්‍යාපෘතිය සඳහා යෝජිත කාලරාමුව සහ හඳුනාගත් කඩඉම් ;

(ඉ) (i) විදුලිබලය මිල දී ගැනීම සඳහා අයකුම ව්‍යුහය ;

(ii) අයකුම ගෙවීමේ ව්‍යුහය සහ ව්‍යවහාර මුදල් ; සහ

(iii) විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුමේ කාලසීමාව,

ඇතුළත් තාක්ෂණික සහ වාණිජ දත්ත ;

(ඊ) යම් බැහැර කිරීම්, සීමා කිරීම් සහ අදාළ වන වියාචනයන්.

(2) පහත සඳහන් කරුණු ඇතුළත් ව්‍යාපෘති යෝජකයන් සඳහා වන උපදෙස් :-

(අ) ව්‍යාපෘතිය කරගෙනයාමට යෝජනාව ලෙස භාර දිය යුතු අයදුම්පත්‍ර ආකෘතිය (ව්‍යාපෘති යෝජනාව) ;

(ආ) ව්‍යාපෘති යෝජකයා විසින් සැපයිය යුතු කිසියම් භාරගැනීමක් ඇතුළත් ආවරණ ලිපියේ ආකෘතිය ;

(ඇ) ජාල උපපොළ වෙත සිදු කරන අධීක්ෂණයන් පිළිබඳ විස්තර ;

(ඈ) කොමිෂන් සභාවේ අදහස් විමසා බලපත්‍රලාභියාට යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනය සංශෝධනය කිරීම සඳහා අයිතියක් ඇති බවට වූ ප්‍රකාශනයක් සහ සංශෝධන පිළිබඳ තොරතුරු ;

(ඉ) යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනය සහ ඇගයීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබා ගන්නා ආකාරය ;

(ඊ) යෝජිත රැස්වීම් සහ සාකච්ඡා පිළිබඳ විස්තර ;

(උ) ශක්‍යතා අධ්‍යයනයක් සම්පූර්ණ කර තිබෙන්නේ ද නැතහොත් ව්‍යාපෘති යෝජක විසින් එය සැපයිය යුතු ද යන්න පිළිබඳ විස්තර ;

(ඌ) ස්කන්ධය සහ ණය අතර අවම අනුපාතය සහ මුදල් සැපයීම සම්බන්ද කිසියම් වෙනත් කොන්දේසි ;

(එ) මූලික ව්‍යාපෘති යෝජනාව භාරදීමේ සිට ව්‍යාපෘතිය නියම කිරීම දක්වා සහ ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් අතරතුර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එක් එක් අදියරේ දී ව්‍යාපෘති යෝජක විසින් යම් සුරැකුම් සැපයිය යුතු නම් එම සුරැකුම් පිළිබඳ විස්තර ;

(ඒ) ව්‍යාපෘති යෝජකට අදාළ විය හැකි කිසියම් වෙනත් කොන්දේසි ;

(ඔ) පහත දැක්වෙන දෑ ඇතුළුව ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමේ ආකාරය :-

(i) අයදුම්පත්‍රයේ ඇතුළත් විය යුතු තොරතුරු සහ විස්තර ;

(ii) ව්‍යාපෘති යෝජනාවේ ආකෘතිය, මුද්‍රා තැබීම, සළකුණු කිරීම සහ භාරදීම ;

(ඕ) බලපත්‍රලාභියාට භාරදුන් ව්‍යාපෘති යෝජනාවක් ව්‍යාපෘති යෝජක විසින් ඉදිරිපත් කළ ලංසු තැබීමේ අර්පණයක් ලෙසට සලකනු ලබන බවට වූ ප්‍රකාශනයක් ;

(ක) ව්‍යාපෘති යෝජකයෙක් විසින් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාවක් වලංගු වන කාලසීමාව නිශ්චිතව දක්වන සහ අදාළ වෙනත් විස්තර ඇතුළත් ප්‍රකාශනයක් ;

(ග) ව්‍යාපෘති යෝජනා භාරදීමේ අවසන් දිනය ;

(ච) ව්‍යාපෘතිය අදාළ ව්‍යාපෘති යෝජකට පිරිනමනු ලැබුව ද නොලැබුව ද විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමේ පිරිවැය ව්‍යාපෘති යෝජක විසින් දරනු ලබන බවට ප්‍රකාශයක් ;

(ඡ) ව්‍යාපෘති යෝජකයේ වෙනත් යම් වගකීම් ;

(3) ව්‍යාපෘතිය සඳහා ලබාගත හැකි කිසියම් දිරිදීමනා හෝ සහන පිළිබඳ තොරතුරු.

(4) පහත කරුණු සම්බන්ධ අවශ්‍යතාවන් ඇතුළත්ව ව්‍යාපෘතිය සහ කාර්යසාධන පිරිවිතර පිළිබඳ විස්තරයක් :-

(අ) ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට නියමිත තාක්ෂණය ;

(ආ) තාක්ෂණ තොරතුරු ;

(ඇ) විදුලිබල සම්ප්‍රේෂණය ; සහ

(ඈ) අදාළ වන්නේ නම්, කිසියම් බලශක්ති මූලාශ්‍රයක් භාවිතා කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හෝ වෙනත් පිළියම්.

(5) පහත කරුණු ඇතුළත්ව පාරිසරික සහ වෙනත් සලකා බැලීම් :-

(අ) සාමාන්‍ය පාරිසරික අවශ්‍යතාවන් ;

(ආ) කිසියම් ඝන හෝ ද්‍රව අපවාහන බැහැර කිරීම ආශ්‍රිත අවශ්‍යතාවන් ;

(ඇ) විමෝචනය පාලනය කිරීම ආශ්‍රිත අවශ්‍යතාවන් ; සහ

(ඈ) පුරාවිද්‍යාත්මක, සාමාජීය බලපෑම් අවශ්‍යතාවන් ;

(6) ව්‍යාපෘති යෝජකගේ අත්දැකීම් සම්බනධ අවශ්‍යතාවන් ;

(7) (අදාළ වන්නේ නම්) විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම, විදුලිබල මූලාශ්‍රය සැපයුම් ගිවිසුම ඇතුළු ව්‍යාපෘතිය පිරිනමා ඇති ව්‍යාපෘති යෝජක විසින් බලපත්‍රලාභියා හෝ කිසියම් හඳුනාගත් තුන්වන පාර්ශ්ව සමග අතිකර ගැනීමට නියමිත ව්‍යාපෘති ගිවිසුම් පිළිබඳ විස්තරය.

(8) සාමාන්‍ය වෝල්ටීයතාව සහ සංඛ්‍යාත මෙහෙයුම් පරාස සහ සම්ප්‍රේෂණ හැකියාව අනුව උත්පාදන පිරියත සම්බන්ධ කරනු ලබන පද්ධතියේ පහත දක්වෙන ලක්ෂණ ;

(අ) පද්ධති සම්බන්ධතාවක් පිහිටුවීම ආශ්‍රිත වැඩපිළිවෙල සහ පිරිවැය සහ පද්ධතිය භාවිතා කිරීම සඳහා ගාස්තු ;

(ආ) පිරියතේ සහ උපකරණවල අපේක්ෂිත ගුණාත්මකභාවය ;

(ඇ) එක් එක් ජාල උපපොළවල දී ඉඩ සැළසිය හැකි උපරිම ධාරිතාව ; සහ

(ඈ) එක් එක් ජාල උපපොළවල ඇති සම්බන්ධතා වෝල්ටීයතාව.

(9) නව උත්පාදන ධාරිතාවයක් සඳහා වන අවශ්‍යතාවන් පිළිබඳ විස්තර.

8. ව්‍යාපෘති යෝජක විසින් යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනය සකස් කිරීමේ දී වෙනත් අවශ්‍යතාවන්ට අතිරේකව පහත දක්වෙන තොරතුරු සැපයිය යුතු ය :-

(i) ව්‍යාපෘති යෝජක ඇතුළත් වන සියලුම තනි නෛතික අස්ථිත්‍යවල නම් සහ පළපුරුද්ද ;

(ii) ව්‍යාපෘති යෝජකගේ සෑම සාමාජිකයෙක්ම සහ අදාළ මව් සමාගමේ හෝ අනුබද්ධ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ;

(iii) ව්‍යාපෘති යෝජකගේ හෝ එහි අදාළ මව් සමාගමේ හෝ අනුබද්ධ සමාගමේ එක් එක් සාමාජිකයා විසින් (පසුගිය වසර දහය තුළ) සම්පූර්ණ කළ අදාළ ව්‍යාපෘති ඇතුළු ව්‍යාපෘති යෝජකගේ එක් එක් සාමාජිකයාගේ පළපුරුද්ද පිළිබඳ කාලසීමාව සහ ව්‍යාපෘති යෝජක හෝ එහි අදාළ මව් සමාගමේ හෝ අනුබද්ධ සමාගමේ එක් එක් සාමජිකයා නිරතව සිටින අදාළ සියලුම කෙරීගෙන යන ව්‍යාපෘති ලැයිස්තුව ;

(iv) ව්‍යාපෘති යෝජක විසින් ව්‍යාපෘතියට භාවිතා කිරීමට යෝජිත උපකරණ හෝ ද්‍රව්‍ය සපයන සැපයුම්කරු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ;

(v) ණය ස්කන්ධ අනුපාතිකය සහ ව්‍යාපෘතියේ කාලසීමාව සඳහා වූ වෙනත් විස්තර ඇතුළු ව්‍යාපෘති යෝජකගේ අරමුදල් සැපයීම පිළිබඳ විස්තර ;

(vi) ව්‍යාපෘතියේ ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කරන වියදම් පුරෝකථනය පිළිබඳ විස්තර ;

(vii) පහත දක්වෙන කරුණු ඇතුළත් ව ව්‍යාපෘති යෝජක විසින් ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට නියමිත තාක්ෂණය පිළිබඳ තාක්ෂණික තොරතුරු :-

(අ) භාවිතා කිරීමට නියමිත තාක්ෂණය පිළිබඳ විස්තර ;

(ආ) විදුලිබල සම්ප්‍රේෂණය පිළිබඳ විස්තර ; සහ

(ඇ) අනෙකුත් සියලුම අදාළ තාක්ෂණික විස්තර.

(viii) පිරියත සඳහා හඳුනාගත් ස්ථානය සහ ප්‍රාරම්භක පාරිසරික, පුරාවිද්‍යාත්මක, සාමාජීය බලපෑම් ඇගයීම.

(ix) කිසියම් තොරතුරක් සැපයීමේ දී එළැඹුනු කිසියම් උපකල්පනයක්.

9. පහත කරුණු ඇතුළත් විය හැකි ව්‍යාපෘති යෝජනා සැසඳීමේ දී සහය වීම සඳහා අනාගත සැපයුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු, උපලේඛන මගින් ව්‍යාපෘති යෝජනා සකස් විය යුතු බව යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනයෙන් ඉල්ලිය යුතු ය :-

(i) පාදක භාරය සහ උපරිම භාරය ආදී විදුලිබලයේ විවිධ කොටස් සඳහා මිල ගණන් ;

(ii) සාමාන්‍ය පණ ගැන්වීමේ සහ ක්‍රියා විරහිත කිරීමේ මිල ගණන් ;

(iii) ධාරිතාව සැපයීම සඳහා බලපත්‍රලාභියා විසින් ගෙවීමට අපේක්ෂිත ගාස්තු ;

(iv) ජාල සංග්‍රහයේ දක්වා ඇති කොන්දේසි සමග අනුකූලවීමට සාක්ෂියක් ලෙස සපයා ඇති තාක්ෂණික පිරියත දත්ත ;

(v) පිරියතේ හැකියාව ;

(vi) අනුබද්ධ සේවා සැපයීමට හැකියාව දක්වන තාක්ෂණික දත්ත සහ ඒවා ආශ්‍රිත මිල ගණන් ; සහ

(vii) කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි වෙනත් එවැනි විස්තර.

10. යෝජනා සඳහා ඉල්ලීමේ ලේඛනයට පහත දක්වෙන කරුණු ඇතුළත්ව ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ පිරිනැමීම ආශ්‍රිත තොරතුරු ඇතුළත් විය යුතු ය :-

(1) ඇගයීම් ක්‍රියාවලියේ දළ සටහනක් ;

(2) ව්‍යාපෘති යෝජනාව විවෘත කිරීම සහ සෑම ප්‍රතිෂ්ඨාවකම වැදගත්කම සහ ප්‍රදානය කිරීමේ පදනම සහ බලපත්‍රලාභියා විසින් භාර ගන්නා රහස්‍යභාවයේ වගකීම් ඇතුළු ව්‍යාපෘති යෝජනාවේ සෑම අංශයක්ම සලකා බලන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ;

(3) ඕනෑම ව්‍යාපෘති යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍රලාභියා සතු අයිතිය සුරකින ප්‍රකාශනයක් ;

(4) පහත දක්වෙන දේ ඇතුළත් ඇගයීමේ දී සලකා බැලිය යුතු කරුණු :-

(අ) ව්‍යාපෘති යෝජනාව සම්පූර්ණ වන්නේ ද සහ යෝජනාව සඳහා ඉල්ලීමේ ලේඛනයේ දක්වා ඇති අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබෙන්නේ ද යන්න පිළිබඳ ව්‍යාපෘති යෝජනාවේ ප්‍රතිචාර්යතාව ;

(ආ) ස්කන්ධය සහභාගීත්වය, සංවර්ධන අත්දැකීම, අයකුම යෝජනා, කාර්යමණ්ඩලයේ අත්දැකීම, උපකරණවල ගුණාත්මකභාවය, උපකරණවල විශ්වාසනීයත්වය සහ කාලානුරූප සම්පූර්ණ කිරීම, බලපත්‍රලාභියාගේ ජාල සංග්‍රහයේ අවශ්‍යතාවන්ට අනුකූලවීම, භාරය අනුව සැපයීමේ හැකියාවේ නම්‍යශීලීත්වය, පිරියතේ අපේක්ෂිත ආරම්භ කිරීම, පාරිසරික සලකා බැලීම්, මෙහෙයුම් වැඩකටයුතු ඇතුළු තාක්ෂණික සහ වාණිජ යෝජනා ;

(ඇ) ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීමේ ශක්තිය සහ සපයන ලද සුරැකුම ඇතුළු ඒ සඳහා වන අවශ්‍යතාවන් ;

(ඈ) බලපත්‍රලාභියා විසින් බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූලවීම ;

(ඉ) පවතින පිරියතෙහි උපයෝගීතාව සහ ගිවිසුම්ගත තත්ත්වය කෙරෙහි යෝජිත ව්‍යාපෘතියේ බලපෑම ;

(ඊ) සම්බන්ධතා පිරිවැය ඇතුළු අවශ්‍ය කරන සම්ප්‍රේෂණ ආයෝජනය සහ පද්ධතියේ බලශක්ති හානිය කෙරෙහි වන බලපෑම ;

(උ) ඉල්ලුම සොයා ගැනීමට සහ අනුබද්ධ සේවාවන් සැපයීමට සංවර්ධන පිරියත මිශ්‍රණයේ නම්‍යශීලීත්වය ;

(ඌ) යෝජිත ස්ථානවල දී යෝජිත බලශක්ති මූලාශ්‍රය, වෙනත් යෙදවුම් ද්‍රව්‍ය සහ අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව හෝ ප්‍රවේශවීමේ හැකියාව ;

(ඵ) යෝජිත බලශක්ති මූලාශ්‍රය ප්‍රසම්පාදනය සඳහා යෝජිත යටිතල පහසුකම් සහ ගිවිසුම්ගත වැඩකටයුතු ;

(ඒ) ඉදිකිරීමේ කාලසීමාව සහ ආශ්‍රිත පිරිවැය සහ සුරැකුම් අනුමිති ; සහ

(ඔ) ස්ථානයේ නිශ්චිත පාරිසරික සලකා බැලීම්.

11. බලපත්‍රලාභියා විසින්, ව්‍යාපෘති යෝජනා ඇගයීමෙන් පසු එම බලපත්‍රලාභියා විසින් පනතේ 43 (5) වැනි වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ අනුමතය සඳහා වඩාත් යෝග්‍ය ව්‍යාපෘති යෝජක නිර්දේශ කළ යුතු ය.

12. නව උත්පාදන ධාරිතාවක අනාගත සැපයුම්කරු සමග ඇති කර ගත් සාකච්ඡාවලින් පසුව බලපත්‍රලාභියා විසින් පිරිවිතරවලට සම්බන්ධ කළ හැකි, කෙටුම්පත් කළ විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුමට හා එහි සිදු කරන ලද කිසියම් වෙනස්කමකට ද කොමිෂන් සභාවේ අනුමතය ලබා ගත යුතු ය.

13. මෙම රීතිවල, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :-

''පනත'' යන්නෙන්, 2013 අංක 31 දරන පනතින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදහස් වේ ;

''ජාල සංග්‍රහය'' යන්නෙන් පනතට අනුකූලව සකස් කළ ශ්‍රී ලංකා ජාල සංග්‍රහය අදහස් වේ ;

''ජාල උපපොළ'' යන්නෙන් ලැබෙන විදුලිබල සැපයුම ඉහළ වෝල්ටීයතාවකින් යුක්ත වන විට විදුලිබලය පරිවර්තනය, පරිණාමනය, මාරු කිරීම හෝ පාලනය සඳහා අවශ්‍ය කිසියම් ගෙවැද්දීමක් ඇතුළු උපකරණ එකලස් කිරීමක් අදහස් වේ ;

''නව උත්පාදන ධාරිතාව'' යන්නෙන් සම්ප්‍රේෂණ පද්ධතියට ඍජුව සම්බන්ධ කිරීමට නියමිත හෝ සම්බන්ධ කර ඇති නව උත්පාදන පිරියතක් හෝ පවතින උත්පාදන පිරියතක් දීර්ඝ කිරීමක් අදහස් වේ ;

''ව්‍යාපෘති යෝජක'' යන්නෙන්, අවශ්‍ය කරන උත්පාදන ධාරිතාව සැපයීමට උනන්දුවක් දක්වන ඕනෑම තැනැත්තෙකු අදහස් වේ.

07 - 340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.